# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,579 — 1958 නොවැම්බර් 7 වැනි සිකුරාද — 7.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)

| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 993 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අයි වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 993 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 995 |

## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.ඩී—ජී සී 14/40.

### 1952 අංක 6 දරණ ප්‍රදෙශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952 අංක 6 දරණ ප්‍රදෙශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ මැදපළාත ගම් ප්‍රදෙශයේ ගම්කායශී සභාව විසින් සම්මත කරගන්නාලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

#### යෝජනාව

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනලද්දාවූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1953 ක්‍රි වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල 12, 13 සහ 16 යන කාණ්ඩ 1959 ජනවාරි මස පළමුවැනි දින සිට සම්මත කර ගැනීමට මැදපළාත ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව විසින් 1952 කේ අංක 6 දරණ ප්‍රදෙශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් යෝජනා කරනු ලැබේ.

ඇස්. මොහමඩ් සාලි,
මැදපළාත ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාවේ ප්‍රධානතුමා.

මැදපළාත ගම්කායශී සභා කායශීලය,
නාත්තන්ඩිය, 7.10.1958.

## අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී. ඩී/ජීජේ 9/1.

### ගම්සභා ආඥාපනත

ගම් සභා ආඥාපනතේ (198 වැනි පරිචෙඡ්දයේ) 49 වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තු ගම් ප්‍රදේශයේ ගම් කායශී සභාව විසින් සම්පාදිතව 1947 ක්‍රි වූ සැප්තැම්බර් මස 24 වන දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1958 ක්‍රි වූ ඔක්තෝබර් මස 23 වැනි දින.
කොළඹ දී ය.

### අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත පිළිබඳවූ අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(3) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම.
(4) විනාකිරි සෑදීම.
(5) සබන් සෑදීම.
(6) දුම් කොළ වියලීම, සකස්කිරීම හෝ ගබඩා කිරීම.
(7) හම් පදම්කරන ස්ථානයක් තබාගැනීම.
(8) පුවක් වේලා සකස්කිරීම.

(9) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උණු කිරීම.
(10) සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම.
(11) රබර් සීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම.
(12) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(13) කෝඩා සෑදීම.
(14) ලෑලි පොගවා සකස් කිරීම.
(15) පොල් ලෙලි පෙගවීම සඳහා (පොල් ලෙලි) කොටුවක් තබා ගැනීම.
(16) මාළු අයිස් දැමීම.
(17) සුරුට්ටු, සිගරට් හෝ බීඩි සෑදීම.
(18) පැණි හෝ හකුරු සෑදීම.
(19) රබර් සෑදීම හෝ වියලා සකස් කිරීම.
(20) රා ගබඩා කිරීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) සිසිල් බීම සෑදීම හෝ ගබඩා කිරීම.
(2) කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම.
(3) තෙල් වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ විදුලි බලයෙන් හෝ ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්.
(4) කබුක්ගල්, බොරළු, කළුගල් ලබාගැනීමට වළවල් කැනීම හෝ වලවල් තබාගැනීම.
(5) මිණිරන් වියලීම හෝ ගබඩා කිරීම.
(6) වලක් කැනීමෙන් හුණු ගල් ලබාගැනීම.
(7) හාල් හෝ වී මෝලක් තබාගැනීම.
(8) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල් තෙල් සිඳීම.
(9) සෙක්කුවකින් පොල් තෙල් සිඳීම.
(10) දර හෝ ලී මඩුවක් තබාගැනීම.
(11) කෙඳිවගී නෙලීම හෝ ගබඩා කිරීම.
(12) කපු පුළුන්, නූල් හෝ පිදුරු ගබඩා කිරීම.
(13) භූමි තෙල් ගබඩාවක් තබාගැනීම.
(14) මුද්‍රණාලයක් තබාගැනීම.
(15) කපාපු පොල් සකස් කිරීම.
(16) සවර්ණාභරන සෑදීම.
(17) අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම.
(18) අම්ලකර වායුව පාවිච්චි කරන "ගරාජයක්" තබාගැනීම.
(19) පොල් කටු අඟුරු ගබඩා කිරීම.
(20) කම්හලක් තබාගැනීම.
(21) වඩු මඩුවක් තබාගැනීම.
(22) තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම.
(23) විකිණීම පිණිස වී ගෝනි හෝ මලු 15 කට වඩා ගබඩා කර තබාගැනීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි වගී සායම් කිරීම.
(2) ගඩොල් හෝ උළු පිච්චීම.
(3) බැටරි චාජ් කිරීම.
(4) අඟුරු සඳහා පොල් කටු පිච්චීම.
(5) හුණු ගල් පිච්චවීම, ගබඩා කිරීම හෝ කැබලි කිරීම.

---

ඇල්.ඩී.—බී. 71/46

---

ඇල්.ජී.ඩී.—ජී ඒ 11/11/4

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩගම්පහ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹදීය.

### අප්‍රසන්නවූ හා අන්තරාදායක වූ කර්මාන්ත සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සළකනු ලැබේ :—
(1) ජාඩි හෝ කරවල ගබඩාකිරීම.
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(3) කොම්පෝස්ට් පෝර හෝ කෘත්‍රිම පෝර හෝ සෑදීම.
(4) විනාකිරි සෑදීම.
(5) රබර් වියළීම හෝ සෑදීම.
(6) සබන් සෑදීම.
(7) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම.
(8) පුවක් වියලා සකස්කිරීම.
(9) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උණු කිරීම.
(10) සතුන්ගේ හම් හෝ ඇටකටු හෝ ගබඩා කිරීම.
(11) මාලු අයිස් දැමීම.
(12) ලෑලි පොගවා සකස්කිරීම.
(13) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සවීම හෝ සෑදීම.
(14) කෘත්‍රිම පෝර හෝ කෘත්‍රිම පෝර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(15) දුම්කොල වියලා සකස්කිරීම.
(16) රා එකතු කරන ස්ථානයක් තබාගැනීම.
(17) බීඩි සෑදීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කොප්පරා වේලීම.
(2) කබුක්ගල් හෝ බොරළු ලබාගැනීමට ගල් වළක් කැපීම.
(3) කොප්පරා ගබඩාකිරීම.
(4) පිදුරු ගබඩාකිරීම.
(5) කපාපු පොල් සකස්කිරීම.
(6) මිනිරන් වියලීම හෝ ගබඩා කිරීම.
(7) වළක් කැණීමෙන් හුණුගල් ලබාගැනීම.
(8) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල්තෙල් සිඳීම.
(9) කෙඳි වගී නෙලීම හෝ ගබඩාකිරීම.
(10) කපු පුළුන් නූල් ආදිය ගබඩාකිරීම.
(11) ගිණිකූරු සෑදීම.
(12) බූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.
(13) සවර්ණාභරණ සෑදීමේ ස්ථානයක් තබාගැනීම.
(14) කම්හලක් තබාගැනීම.
(15) තෙල් වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්‍රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක් කරගෙන යාම.

3. පහත සඳහන් කර්මාන්ත අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකණු ලැබේ :—

(1) හුණු පිච්චීම හෝ ගබඩාකිරීම.
(2) තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම:
(3) හාල් හෝ වී මෝලක් තබාගැනීම.
(4) ලී ගබඩාකිරීම.

---

ජීබී 14/31/8.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පලවූ ප්‍රකාශනයේ සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් 23,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථා

### නිලධාරීන් හා මෙහෙකරුවෝ

1. කාර්ය සභාවට ලැබිය යුතු සියලුම අයබදු ගාස්තු එකතු කොට කාර්ය සභාවේ මුද්‍රාව හා ප්‍රධාන තුමාගේ අත්සනේ නිවැරිදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස ප්‍රධාන තුමා විසින් ඕනෑම නිලධාරියෙකුට හෝ වෙනත් කෙනෙකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

2. කිසිවකු විසින්—

(අ) ගම්සභා ආඥාපනතේ හෝ ඒ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ යම් විධිවිධාන යටතේ හෝ ප්‍රධානතුමාට හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකුට පවරා ඇති යම් බලයක් පාවිච්චි කිරීමේ දී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉටු කිරීමේදී හෝ නියමකොට ඇති යම් කාර්යයක් ක්‍රියාවේ යෙදවීමේදී එකී ප්‍රධානතුමාට හෝ නිලධාරියාට, හෝ

(ආ) කාය්‍යී සභාවෙන් හෝ කාය්‍යී සභාව වෙනුවෙන් රක්‍ෂාවට යොදා ගන්නා ලද යම් මෙහෙකරුවෙකුට හෝ වැඩකරුවෙකුට ප්‍රධානතුමා විසින් හෝ කාය්‍යී සභාවේ වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී ඒ මෙහෙකරුවාට හෝ වැඩකරුවාට හෝ ඕනෑකමින් බාධා නොකළ යුතුයි.

3. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාය්‍යී සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.

"කාය්‍යී සභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම් ප්‍රදේශයේ කාය්‍යී සභාව අදහස් කරනු ලැබේ,

"ආඥපනත" යනුවෙන් ගම්සභා ආඥපනත් (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

---

ඇල්. ජී. ඞී.—ජී සී. 14/10.

## සුසානභූමි හා භූමිදාන කිරීම පිළිබඳ ආඥාපණත

වැඋඩ ගම්ප්‍රදේශයේ පාලන බල සීමා ඇතුළත පිහිටි සුසානභූමි සඳහා, ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 51 වැනි වගන්තිය සම්බන්ධකොට ගත් සුසානභූමි හා භූමිදාන කිරීම පිළිබඳ ආඥපනතේ (181 වැනි පරිච්ඡේදයේ) 38 වැනි වගන්තිය යටතේ විධිවූ බලමණ්ඩලය විසින් එනම් වැඋඩ ගම්ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව විසින් සම්පාදිතව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පලවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ යථොක්ත සුසානභූමි හා භූමිදාන කිරීම පිළිබද ආඥපනතේ 39 වැනි වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් සථිර කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් 23,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1. (1) මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකරන දිනයේදී ගම්ප්‍රදේශ සීමා ඇතුළත පවත්නා සෑම සුසානභූමියකම අයිතිකාරයා විසින් එකී දින සිට මාස දෙකක් ඇතුළතදී එකී සුසානභූමිය ලියාපදිංචි කරන මෙන් ඉල්ලා සිටිය යුතුයි.

(2) මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකළාට පසු යම් දවසක ගම් ප්‍රදේශ සීමා ඇතුළත පිහිටුවීමට අදහස් කරන සෑම සුසානභූමියකම අයිතිකාරයා විසින් එකී දවසට අඩුගණනේ මාසයකටවත් කලින් එකී සුසානභූමිය ලියාපදිංචි කරන මෙන් ඉල්ලා සිටිය යුතුයි.

2. (1) සුසානභූමියක් ලියාපදිංචි කිරීම සඳහාවූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ලියවිල්ලකින් විය යුතුවාත් හැර එය අයිතිකාරයා විසින් අත්සන් කරනු ලැබ ප්‍රධානතුමා නමට එවිය යුතුද වන්නේය.

(2) සර්වෙයර් ජනරාල්තුමා විසින් හෝ එතුමා වෙනුවෙන් හෝ විධිවූ පරිදි බලපත්‍ර ලත් මිනින්දෝරු මහතකු විසින් හෝ සහතික කරන ලද ඒ සුසානභූමියේ සැලැස්මක් අයිතිකාරයා විසින් ඉල්ලුම්පත්‍රය සමග ඔප්පුකළ යුතුයි.

(3) (අ) අයිතිකාරයා විසින් සොහොන් ගොව්වකු (සුසානභූමිය රැකබලා ගන්නා අය) වශයෙන් යම් කිසිවකු පත්කිරීමට අදහස් කරන්නේ නම් එකී සොහොන් ගොව්වාගේ නමද ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුයි.

(ආ) ඒ තනතුර හා එකී තනතුරට අයත් යුතුකම් භාර ගැනීමට තමා කැමැත්ත දක්වූ බවට සොහොන් ගොව්වා වශයෙන් නම් කරන ලද අයද ඉල්ලුම් පත්‍රයෙහි අත්සන් කළ යුතුයි.

3. සොහොන් ගොව්වාගේ නම ඉල්ලුම් පත්‍රයේ සඳහන් නොකරන ලද විට හෝ, 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරන ලද ප්‍රකාරයට එසේ නම් කරන ලද සොහොන් ගොව්වා අත්සන්කර නැති විට හෝ, සුසානභූමිය ලියාපදිංචි කරනු ලැබූ කල්හි ඒ අයිතිකාරයා එකී සුසානභූමියේ සොහොන් ගොව්වා වශයෙන් සලකනු ලැබේ.

4. සුසානභූමියක සොහොන් ගොව්වා මැරුනොත් හෝ කවර හේතුවකින් වුවද ඔහුට ඔහුගේ යුතුකම් ඉෂ්ට කිරීමට බැරිකමක් සිදුවුව හොත් හෝ වෙනත් සොහොන් ගොව්වකුගේ නම ලියාපදිංචි කළ යුතුයි. ප්‍රධානතුමාගේ හෝ එතුමා නැති විටක උප ප්‍රධානතුමාගේ හෝ විශේෂ අවසර ඇතිව මිස නැත්නම් අලුතෙන් සොහොන් ගොව්වකුගේ නම ලියාපදිංචි කරන තුරු එකී සුසානභූමියෙහි කිසිම භූමිදානයක් හෝ ආදාහනයක් හෝ සිදු නොකළ යුතුයි.

5. (1) සුසානභූමියක සොහොන් ගොව්වකු විසින් ඒ සුසානභූමියේ සිදුකරනු ලබන සෑම භූමිදානයක් හෝ ආදාහනයක්ම පිළිබඳවූ විස්තර ලේඛන පොතක සටහන් කළ යුතුවාත් හැර එකී භූමිදානය හෝ ආදාහනය සිදුකොට පැය විසි හතරක් ඇතුළතදී එකී සටහනේ සැබෑ පිටපතක් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) ඒ ලේඛන පොත ප්‍රධානතුමා අනුමත කරන ප්‍රකාරයට විය යුතුයි.

6. සුසානභූමියක සොහොන් ගොව්වා විසින් ප්‍රධානතුමාට හෝ ඒ සඳහා ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් යම් කිසිවකුට හෝ ඕනෑම වේලාවකදී—

(අ) සුසාන භූමිය පරීක්ෂා කිරීමටත්,

(ආ) 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරන ලද ලේඛන පොත පරීක්‍ෂාකර බැලීමටත්

ඉඩදිය යුතුයි.

7. සුසානභූමියක අයිතිකාරයා විසින් ප්‍රධානතුමා තෘප්තිමත්වන පරිදි එය වටේට වැටක් බැඳ ඒ වැට මනා තත්වයක තබාගත යුතුයි.

8. සුසානභූමියක අයිතිකාරයා විසින් ප්‍රධානතුමා තෘප්තිමත්වන පරිදි එහි කැලෑව ශුද්ධකොට පිරිසිදුවූ හා සනීපාරක්‍ෂකවූ තත්වයක තබාගත යුතුයි.

9. ගැඹුරින් අඩි පහකට අඩුව හෝ දුරින් වෙනත් යම් මිනීවළක සිට අඩි තුනකට අඩුව හෝ කිසිම මිනීවළක් කැපිය යුතු නැත.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාය්‍යී සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාය්‍යී සභාව" යනුවෙන් වැඋඩ ගම් ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් වැඋඩ ගම්ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

"අයිතිකාරයා" යනුවෙන් සුසානභූමියක භාරකාරයා, පාලකයා, අයිතිකාරයා හෝ සුසානභූමියකට අයිතිවාසිකම් දක්වීමට හිමිකම් ඇති වෙනත් කෙනෙකු හෝ අදහස් කරනු ලැබේ.

---

# විවිධ දන්වීම්

## හලාවත දිස්ත්‍රික්කයේ මැද පළාත ගම්කාය්‍යී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්‍ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඩව හලාවත දිස්ත්‍රික්කයේ මැද පළාත ගම්කාය්‍යී සභා ප්‍රදෙශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඩ වන්නේ අසවල් කරුණ නිසායයි සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශොධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
| --- | --- |
| 1. ඇම්. ඞී. ප්‍රන්සිස් අප්පුහාමි, මයිලාව, නාත්තන්ඩිය | කැකුලාවාඩියේ ආර්. ඞී. ඉසබෙල්හාමි මහත්මියට අයිති කැකුලාවාඩියේ පිහිටි මීගහවත්ත නමැති ඉඩමේ පිහිටි මස්කඩය—ඌරුමස්. |
| 2. ඇම්. ඞී. ප්‍රන්සිස් අප්පුහාමි, මයිලාව, නාත්තන්ඩිය | ඩබ්ලිව්. ජේරමියස් ප්‍රනාන්දු මහතාට අයිති නාත්තන්ඩිය නගරයේ පිහිටි තක්සේරු අංක 51 දරණ ගොඩනැගිල්ල—හරක් මස් සහ එළුමස්. |
| 3. ඇල්. ඒ. හියුබර්ට්, වීරහේන, මාරාවිල | මුදුකටුවේ ඇම්. ඩබ්ලිව්. සිල්වෙස්ත්‍රී පීරිස් මහත්මයාට අයිති මුදුකටුවේ පිහිටි කොස්ගහවත්ත නමැති ඉඩමේ පිහිටි මස් කඩය—හරක් මස්, එළු මස් සහ ඌරු මස්. |

ඇස්. මොහමඞ් සාලි,
සභාපති.

1958 ඔක්තෝබර් 29 වැනි දින,
මැද පළාත ගම්කාය්‍යී සභා කාය්‍යාලය, නාත්තන්ඩිය.

## මාතලේ මැදසිය පත්තු ගම්කායඞී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සදහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬවන මාතලේ මැදසිය පත්තු ගම්කායඞී සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ සඳහා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම "ගැසට් පත්‍රයේ" පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරන ආඥපනතින් සංශොධිත වූ අංක 6 දරන ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම ලිපිනය |
|---|---|
| 1. ඇස්. නූර්මොහමඩ්, මානාබොඩ, උකුවෙල | මානාබොඩ කාන්සයිබු වත්තේ—හරක් මස් කඩය |
| 2. ඒ. අබ්දීන්, ඇල්කඩුව පාර, උකුවෙල | උකුවෙල, උඩකුරුන්තගේතේ වත්ත—හරක් මස් කඩය |

ඇම්. බී. කුලතුංග,
මාතලේ මැදසිය පත්තු ගම්කායඞී සභාවේ
ප්‍රධාන තැන.

1958ක් වූ ඔක්තෝබර් මස 31 වෙනි දින,
මාතලේ මැදසිය පත්තු ගම්කායඞී සභා කායඞීලයේදීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, **සුප්‍රිම් උසාවියේ** පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින සිට** අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශණ කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබෙනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශණ කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.



ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී